ආයතනයේ නම - බණ්ඩාරවෙල මහා නගර සභාව.

අපගේ දැක්ම - ජනහිතකාමී සමෘද්ධිමත් සොඳුරු පුරවරයක්

අපගේ මෙහෙවර - බණ්ඩාරවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික සංවර්ධනය සහතික කරනු සඳහා සහභාගීත්ව ප්‍රවේශයන් තුළ පාරිසරික සංවේදිතාවයෙන් යුතුව, සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගනිමින් සෞඛ්‍යය, මංමාවත්, සැප පහසුකම්, සුභසාධන කටයුතු හා මහජන උපයෝගිතා සේවාවන් ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යෑම සඳහා ඵලදායී සේවාවක් සැලසීම.

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | අදාළ ගාස්තුව |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| **1**<br>#  | **2**<br>ලබා දෙන සේවාව | **3**<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | **4**<br>ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | **5**<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | **6**<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | **7**<br>අදාළ ගාස්තුව |
| 01. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ ඉල්ලුම් පත්‍රය හෝ නාගරික සංවර්ධන ප්‍රදේශ නොවන විට සභාවෙන් ලබා ගත් ඉල්ලුම් පත්‍රය<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 05 (ඉදිකිරීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවුද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය)<br>4. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් (නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශවලට පමණක් අදාළ වේ)<br>5. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>6. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br>8. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක්<br>9. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියා පදිංචි කර තිබිය යුතු ය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. තාක්ෂණ නිලධාරි / මහජන සෞඛ්‍ය පරීක්ෂක ☎ 057-2222275<br>2. විෂය භාර නිලධාරි ☎ 057-2222275<br>3. සැලසුම් කමිටුව | දින 14 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 5000.00 (මහල් ගණන අනුව නිවාස හා වණිජ වශයෙන් වෙනස් වේ.)<br>2. පෙරසැරි ගාස්තුව (සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 උපලේඛනයේ සඳහන් සංවර්ධනයේ ස්වභාවය අනුව වන ගාස්තුව) |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| **1**<br><br>**#** | **2**<br><br>**ලබා දෙන සේවාව** | **3**<br><br>**ඉදිරිපත් කළ යුතු ලියකියවිලි** | **4**<br><br>**සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය** | **5**<br><br>**වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක** | **6**<br><br>**කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය** | **7**<br><br>**අදාළ ගාස්තුව** |
| 02. | ඉඩම් අනු බෙදුම් හා ඒකාබද්ධ කිරීමේ සංවර්ධන සැලසුම් අනුමත කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ ඉල්ලුම් පත්‍රය<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ඉඩම අනු බෙදුමට හෝ ඉඩම් ඒකාබද්ධ කිරීමට අදාළ මිනින්දෝරු සැලැස්මේ පිටපත් 5 ක් (සංවර්ධනයේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය)<br>4. සංවර්ධනයේ ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>5. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>6. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක්<br>7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br>8. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියා පදිංචි කර තිබිය යුතු ය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. තාක්ෂණ නිලධාරි / මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 057-2222275<br>2. විෂය භාර නිලධාරි<br>☎ 057-2222275<br>3. සැලසුම් කමිටුව | දින 14 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව **(නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛ ප්‍රකාරව)**<br>2. පෙරසැරි ගාස්තුව (සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 උපලේඛනයේ සඳහන් සංවර්ධනයේ ස්වභාවය අනුව වන ගාස්තුව) |
| 03. | සංවර්ධන බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. අනුමත කළ සංවර්ධන සැලැස්මේ මුල් පිටපත<br>3. නිකුත් කළ සංවර්ධන බලපත්‍රයේ පිටපත.<br>4. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ දෙපැත්තේ සහතික කළ පිටපතක්.<br>5. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩමේ හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. තාක්ෂණ නිලධාරි<br>☎ 057-2222275<br><br>2. විෂය භාර නිලධාරි<br>☎ 057-2222275 | දින 17 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව සංවර්ධනයේ ස්වභාවය අනුව වෙනස් වේ.<br>2. පෙරසැරි ගාස්තුව අය නොකෙරේ. |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | අදාළ ගාස්තුව |
| 04. | අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමතය දීම | 1. නාගරික සංවර්ධන ප්‍රදේශයක් වන විට, 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ ඉල්ලුම් පත්‍රය හෝ වෙනත් ප්‍රදේශයක් වන විට, පෙරටු කාර්යාලයෙන් ලබා ගත් ඉල්ලුම් පත්‍රය.<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 05 (ඉල්ලීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය)<br>4. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් (*නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශවලට පමණක් අදාළ වේ*)<br>5. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>6. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br>8. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක් | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. තාක්ෂණ නිලධාරි / මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 057-2222275<br>2. විෂය භාර නිලධාරි<br>☎ 057-2222275<br>3. සැලසුම් කමිටුව | දින 28 | 1.ඉල්ලුම් පත්‍ර ගාස්තුව වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් නිවේදන ප්‍රකාරව ගාස්තු අය කරනු ලැබේ.<br>2. පෙරසැරි ගාස්තුව (*සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 වන උපලේඛනයේ සඳහන් සංවර්ධනයේ ස්වභාවය අනුව වන ගාස්තුව*)<br>3. ප්‍රමාද ගාස්තු (*සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 වන උපලේඛනයේ සඳහන් සංවර්ධනයේ ස්වභාවය අනුව වන ගාස්තුව*) |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | අදාළ ගාස්තුව |
| 05. | අනුකූලතා සහතිකය නිකුත් කිරීම | 1. නාගරික සංවර්ධන ප්‍රදේශයක වන විට, නිවැරදිව සම්පූර්ණ කරන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ ඉල්ලුම් පත්‍රය හෝ සෙසු ප්‍රදේශ සඳහා සභාවෙන් ලබා ගත් ඉල්ලුම් පත්‍රය.<br>2. නිකුත් කළ සංවර්ධන බලපත්‍රයේ සහ අනුමත සැලසුමේ පිටපතක් බැගින්.<br>3. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. තාක්ෂණ නිලධාරි / මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 057-2222275<br>2. විෂය භාර නිලධාරි<br>☎ 057-2222275<br>3. සැලසුම් කමිටුව | දින 14 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු 1000.00<br>2. පෙරසැරි ගාස්තුව<br>නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛ ප්‍රකාරව අය කරනු ලබයි. |
| 06. | වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. ඉඩමට අදාළ මිනින්දෝරු සැලැස්මේ පිටපතක්<br>3. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කළ පිටපතක්<br>4. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. තාක්ෂණ නිලධාරි<br>☎ 057-2222275<br>2. විෂය භාර නිලධාරි<br>☎ 057-2222275. | වීථි රේඛා නියම කර -<br>1. නැති විට, දින 05<br>2. ඇති විට, දින 1 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 5000.00<br>2. පෙරසැරි ගාස්තුව<br>නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛ ප්‍රකාරව අය කරනු ලබයි. |
| 07. | නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 1. දේපළෙහි දත්ත සහිත ව නොපවරා ගැනීමේ සහතිකය ඉල්ලීමේ ලිපියක්<br>2. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>3. සභාවට අය වීමට ඇති සියලු මුදල් ගෙවා අවසන් කර තිබිය යුතු ය. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | | විනාඩි 15 | පෙරසැරි ගාස්තුව අය නොකෙරේ.<br>සහතිකය නිකුත් කිරීමේ ගාස්තුව - රු. 5000.00 |
| 08. | වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වන විට වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සහතික කළ පිටපතක් | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 057-2222275<br>2. තාක්ෂණ නිලධාරි<br>☎ 057-2222275 | දින 03 | සභාවෙන් දැනුම් දෙනු ලබන නිවේදනයේ සඳහන් මුදල |
| 09. | ව්‍යාපාර බද්ද අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ ව්‍යාපාර බදු නිවේදනය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | ආදායම් පරීක්ෂක<br>☎ 057-2222275 | විනාඩි 15 | බදු නිවේදනයේ සඳහන් මුදල |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | අදාළ ගාස්තුව |
| 10. | කර්මාන්ත බද්ද අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ කර්මාන්ත බදු නිවේදනය | පෙරටු කාර්යාල නිලධාරි ☎ 057-2222275 | ආදායම් පරීක්ෂක ☎ 057-2222275 | විනාඩි 15 | බදු නිවේදනයේ සඳහන් මුදල |
| 11. | පරිසර ආරක්ෂණ බලපත්‍රය | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය.<br>2. කර්මාන්තය හෝ ව්‍යාපාරය පිහිටා ඇති ස්ථානයට යන මාර්ගයේ දළ සටහනක්.<br>3. කාර්යයේ යොදවන සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර.<br>4. ව්‍යාපාරය ලියා පදිංචි කිරීමේ සහතිකයේ, සහතික කළ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ)<br>5. ව්‍යාපාරය කරගෙන යන ස්ථානයට අයත් ඉඩමේ ඔප්පුවේ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ)<br>6. කර්මාන්තය / ව්‍යාපාරය කරගෙන යන තැනැත්තාට ඉඩමේ අයිතිය නොමැති නම්, අයිතිකරු සමග එළඹ ගත් ගිවිසුමක් වේ නම් එය හෝ ඉඩමේ අයිතිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපියේ සහතික කළ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ)<br>7. ඉඩමේ අනුමත කළ මිනින්දෝරු සැලැස්මේ සහතික කළ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ)<br>8. අනුමත ගොඩනැගිලි සැලැස්මේ සහතික පිටපතක් (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ) | පෙරටු කාර්යාල නිලධාරි ☎ 057-2222275 | 1. විෂය භාර නිලධාරි ☎ 057-2222275<br>2. තාක්ෂණ නිලධාරි ☎ 057-2222275<br>3. තාක්ෂණික කමිටුව | දින 14 | 1. ඉල්ලුම් පත්‍රය අය නොකෙරේ.<br>2. පරිසර නියෝගවල සඳහන් පෙරසැරි ගාස්තුව<br>3. බලපත්‍ර ගාස්තුව රු. 3,000.00 |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | අදාළ ගාස්තුව |
| 12. | ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන අවසර පත්‍ර නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය;<br>2. A 4 කඩදාසියක මුද්‍රණය කරන ලද, ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීමෙහි සමරූපී ආදර්ශයක් (යොදා ගනු ලබන වර්ණ ද සහිත ව);<br>3. කිසියම් මාර්ගයක රක්ෂිතයක සවි කර ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළ වන පරිදි ඒ මාර්ගයේ අයිතිය ඇති මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් පාලන ආයතනය විසින් ඒ සඳහා අවසර දුන් ලිපියේ මුල් පිටපත;<br>4. කිසියම් මාර්ගයක රක්ෂිතයක සවි කර ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළ ප්‍රචාරක දැන්වීම් පුවරුව ප්‍රදර්ශනය කරන ස්ථානය අයත් වන පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ප්‍රධානියා විසින් නිකුත් කළ ලිපියේ මුල් පිටපත;<br>5. ඉල්ලුම්කරු ඉඩමේ අයිතිකරු නොවන විට, දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් ඒ සඳහා ඉඩ දෙන ලද බව ප්‍රකාශිත ලිපියේ මුල් පිටපත;<br>6. නාගරික සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 104 වන නියෝගය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෝ සභාව විසින් අනුමත කළ බලපත්‍රයේ සහතික කළ පිටපත | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. විෂය භාර නිලධාරි<br>☎ 057-2222275<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 057-2222275 | දින 3 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව අය නොකෙරේ.<br>2. අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති පරිදි දැන්වීමේ වර්ග ඵලය මත අවසර පත්‍ර ගාස්තුව |
| 13. | වරිපනම් අය කිරීම | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ තක්සේරු නිවේදනය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | | විනාඩි 15 | තක්සේරු නිවේදනයේ දැක්වෙන සම්පූර්ණ මුදල |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | අදාළ ගාස්තුව |
| 14. | ආදාහනාගාරය වෙන් කරවා ගැනීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ පිටපතක් (පරීක්ෂා කර බැලීමට මුල් පිටපත අවශ්‍ය වේ)<br>3. මියගිය තැනැත්තාගේ මරණ සහතිකයේ පිටපතක් (පරීක්ෂා කර බැලීම සඳහා මුල් පිටපත අවශ්‍ය වේ. විදේශයක දී සිදු වූ මරණයක් වන විට, ඒ රටේ දී නිකුත් කළ මරණ සහතිකය - ඉංග්‍රීසි භාෂාවෙන් නොවන විට, ඉංග්‍රීසි පරිවර්තනයක් සමග) | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | රාජකාරි වේලාවෙන් පසු අවස්ථාවක් වන විට නම් කළ නිලධාරියා<br>☎ 057-2222275 | විනාඩි 15 | බල ප්‍රදේශය තුළ :-<br>වැඩිහිටි තැනැත්තකු වන විට, රු. **6000.00**<br>බාල වයස් කරුවකු වන විට, රු. **6000.00**<br>2. පිටත:-<br>වැඩිහිටි තැනැත්තකු වන විට,<br>රු. **12,500.00**<br>බාල වයස් කරුවකු වන විට,<br>රු. **12,500.00** |
| 15. | මාර්ග පළුදු කිරීමට අවසර ඉල්ලීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. පළුදු කිරීමට අදහස් කරන මාර්ගයේ නියමිත ස්ථානයට ළඟා විය හැකි පහසු මාර්ගය පෙන්නුම් කරන දළ රූප සටහනක්.<br>3. අදාළ සේවා සම්බන්ධතාව සපයන ආයතනය විසින් නිකුත් කළ ලිපියේ පිටපතක්. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | තාක්ෂණ නිලධාරි<br>☎ 057-2222275 | දින 2 | පළුදු කිරීමේ ප්‍රමාණය අනුව වෙනස් වේ |
| 16. | ගස්වලින් සිදු වන අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම | නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | තාක්ෂණ නිලධාරි<br>☎ 057-2222275 | දින 3 | ගාස්තු අය නොකෙරේ |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1<br>#| 2<br>ලබා දෙන සේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | 4<br>ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
| 17. | විනෝද බද්ද අය කර ගැනීම සහ විනෝද බද්දෙන් නිදහස් කිරීම | 1. විනෝද බද්ද අය කර ගැනීමේ කාර්යය සඳහා -<br>i. අලෙවි කිරීම සඳහා සූදානම් කළ මුද්‍රිත ප්‍රවේශ පත්‍ර;<br>ii. අන්තර්ජාලය ඔස්සේ අලෙවි කිරීමට යෝජිත ප්‍රවේශ පත්‍රවල විද්‍යුත් මුද්‍රාව තැබීම සඳහා පරිගණක මුර පදය<br>2. විනෝද බද්දෙන් නිදහස් කිරීමකට අදාළ වන විට, ඉහත 1 හි පරිදි ක්‍රියා කරමින් -<br>i. අලෙවි කිරීමට යෝජිත ප්‍රවේශ පත්‍රවල වටිනාකම අනුව, පළමුව විනෝද බද්දට සමාන මුදල සභාවේ තැන්පත් කළ යුතු ය;<br>ii. විනෝද බද්ද තැන්පත් කරන අවස්ථාවේ දී ම,විනෝද කාර්යයේ ආදායම් හා වියදම් ඇස්තමේන්තුව<br>iii. විනෝද කාර්යය අවසන් වී දින 30 කට පෙර විනෝද කාර්යයේ සත්‍ය ආදායම් හා වියදම් විස්තරය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | ආදායම් පරීක්ෂක<br>☎ 057-2222275 | 1. දින 02<br>2. ඇමුණුම 02 භාර දුන් දින සිට දින 7 | එක් එක් ප්‍රවේශ පත්‍රයේ මුහුණත වටිනාකමෙන් සියයට පහළොව (15%) ක් බැගින්<br>(අමාත්‍යවරයා විසින් අනුමත කළ, සභා සම්මතය අනුව මේ ප්‍රතිශතය නියම වේ) |
| 18. | උත්සව ශාලා / නගර ශාලා / ප්‍රජා ශාලා කුලියට දීම | නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | 1. පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275<br>2. ශාලාව භාර නිලධාරි<br>☎ 057-2222275 | තාක්ෂණ නිලධාරි<br>☎ 057-2222275 | 1. ශාලාව වෙන් කිරීම විනාඩි 15 | 1. ශාලා ගාස්තුව වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් නිවේදන ප්‍රකාරව ගාස්තු අය කරනු ලැබේ.<br>2 .ආරක්ෂිත ඇපය වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් නිවේදන ප්‍රකාරව ගාස්තු අය කරනු ලැබේ |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** | **6** | **7** |
| **#** | **ලබා දෙන සේවාව** | **ඉදිරිපත් කළ යුතු ලියකියවිලි** | **සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය** | **වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක** | **කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය** | **අදාළ ගාස්තුව** |
| 19. | ක්‍රීඩා පිටි කුලියට දීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | 1. පෙරටු කාර්යාල නිලධාරි ☎ 057-2222275<br>2. ක්‍රීඩා භූමිය භාර නිලධාරි ☎ 057-2222275 | තාක්ෂණ නිලධාරි ☎ 057-2222275 | 1. ක්‍රීඩා පිටිය වෙන් කිරීම විනාඩි 15 | 1. ක්‍රීඩා පිටි ගාස්තුව වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් නිවේදන ප්‍රකාරව ගාස්තු අය කරනු ලැබේ.<br>2. ආරක්ෂිත ඇපය වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් නිවේදන ප්‍රකාරව ගාස්තු අය කරනු ලැබේ. |
| 20. | මල අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව ලබා දීම | නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | 1. පෙරටු කාර්යාල නිලධාරි ☎ 057-2222275<br>2. ගලි බවුසර් රියදුරු ☎ 057-2222275 | 1. තාක්ෂණ නිලධාරි ☎ 057-2222275<br>2. මහජන සෞඛ්‍ය පරීක්ෂක / සෞඛ්‍ය පරිපාලක ☎ 057-2222275 | බවුසරය වෙන් කිරීමට දින 01 | 1. බවුසර් ගාස්තුව (බල ප්‍රදේශයෙන් පිටත සේවා සැපයීමේ දී අතිරේක ගාස්තුවකට යටත් වේ); (වාර්ෂිකව ප්කාශයට පත් කරනු ලබන ගැසට් නිවේදන ප්‍රකාරව ගාස්තුව අය කරනු ලැබේ.) |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** | **6** | **7** |
| **#** | **ලබා දෙන සේවාව** | **ඉදිරිපත් කළ යුතු ලියකියවිලි** | **සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය** | **වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක** | **කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය** | **අදාළ ගාස්තුව** |
| 21. | ජල බවුසර් සේවාව ලබා දීම | නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | 1. පෙරටු කාර්යාල නිලධාරි ☎ 057-2222275<br>2. ජල බවුසර් රියදුරු ☎ 057-2222275 | තාක්ෂණ නිලධාරි ☎ 057-2222275 | බවුසරය වෙන් කිරීමට විනාඩි 15 | 1. බවුසර් ගාස්තුව<br>ජල බවුසර් ගාස්තුව<br>3000L - රු. 2500.00<br>5000L - රු. 3000.00<br>6000L - රු. 3500.00<br>2. ආරක්ෂිත ඇපය අය නොකෙරේ. |
| 22. | දේපළ හිමිකම ලියා පදිංචි කිරීම හා සංශෝධනය කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය (පිටපත් 2 කින් යුක්ත ව)<br>2. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඔප්පුවේ පිටපත් 2 ක් | පෙරටු කාර්යාල නිලධාරි ☎ 057-2222275 | 1. විෂය භාර නිලධාරි ☎ 057-2222275<br>2. ආදායම් පරීක්ෂක ☎ 057-2222275 | දින 14 ක් | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු1000.00<br>2. පෙරසැරි ගාස්තුව අය නොකෙරේ. |
| 23. | ඇතැම් ඉඩම් විකිණීම මත බදු | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ ඇතැම් ඉඩම් විකිණීම මත බදු නිවේදනය | 1. ආදායම් පරීක්ෂක ☎ 057-2222275<br>2. පෙරටු කාර්යාල නිලධාරි ☎ 057-2222275 | විෂය භාර නිලධාරි ☎ 057-2222275 | විනාඩි 15 | ඉඩම විකුණන ලද මුදල් වටිනාකමෙන් සියයට එක(1%) ක් |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1<br>#<br> | 2<br>ලබා දෙන සේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | 4<br>සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
| 24. | ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි බලපත්‍ර නිකුත් කිරීම | 1 නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය;<br>2. A 4 ප්‍රමාණයේ කඩදාසියක අඳින ලද, සැණකෙළියේ කාර්යයට යොදා ගන්නා සෑම අංගයක් ම පෙන්නුම් කරන සැණකෙළි භූමියේ දළ රූප සටහනක්;<br>3. ඒ ස්ථානයට රැස් වන මහජනතාවට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් (ස්ත්‍රී, පුරුෂ සහ ආබාධිත අයට වෙන වෙනම) සපයනු ලබන බවට තහවුරු කරන ලිපියක්;<br>4. ඒ ස්ථානයේ ඉදි කර ඇති තාවකාලික ගොඩනැගිලි ප්‍රමාණවත් සවි ශක්තියකින් යුක්ත වන බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයකු විසින් නිකුත් කළ සහතිකයක්;<br>5. ඒ යම් ගොඩනැගිල්ලක රැස් වන මහජනතාවට දූෂණයට ලක් නොවූ හා ප්‍රමාණවත් වාතාශ්‍රය පවතින බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිකුත් කළ සහතිකයක්;<br>6. හදිසි ගිනි ගැනීමක දී යොදා ගත හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම් උපකරණ (සාමාන්‍ය ගිනි නිවීම්, විදුලි ගිනි නිවීම් සහ ඉන්ධන ගිනි නිවීම් උපකරණ) යොදා ගනු ලබන බව තහවුරු කරන ලිපියක්;<br>7. ආපදා අවස්ථාවක දී, රැස් වී සිටින ජනතාව ඉතා කෙටි කාලයක් ඇතුළත ඉන් ඉවත් කිරීමට ප්‍රමාණවත් පිටවීමේ දොරටු සහ ආරක්ෂිත වැඩ පිළිවෙළ යොදා ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිකුත් කළ සහතිකයක්;<br>8. සැණකෙළි භූමිය තුළ සාමය පවත්වා ගෙන යාමට අවශ්‍ය වැඩ පිළිවෙළ යොදා ඇති බවට ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති විසින් නිකුත් කරන ලද සහතිකයක්. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | 1. විෂය භාර නිලධාරි<br>☎ 057-2222275<br>2. තාක්ෂණ නිලධාරි<br>☎ 057-2222275<br>3. මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 057-2222275 | දින 2 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව අය නොකෙරේ.<br>2. පෙරසැරි ගාස්තුව අය නොකෙරේ.<br>3. බලපත්‍ර ගාස්තුව රු 2000.00 |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** | **6** | **7** |
| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | අදාළ ගාස්තුව |
| 25 | නිවාස නොවන ස්ථානවල කසළ ඉවත් කිරීම | නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 057-2222275 | කමිටුව -<br>1. මහජන සෞඛ්‍ය පරීක්ෂක,<br>2. තාක්ෂණ නිලධාරි හා<br>3. ආදායම් පරීක්ෂක<br>☎ 057-2222275 | දින 2 | 1. කසළ ඉවත් කිරීමේ ගාස්තුව<br>වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් නිවේදන ප්‍රකාරව ගාස්තු අය කරනු ලැබේ<br>2. අතිරේක තැන්පත් මුදල<br>අය නොකෙරේ. |

**අපගේ කැපවීම**

- අවංකව
- ප්‍රඥාවන්තව
- ආචාර සම්පන්නව
- අවබෝධයෙන් යුක්තව
- විෂය මූලිකව හා අපක්ෂපාතිව
- විනිවිද භාවයෙන් යුක්තව
- වගවීමෙන්
- අප්‍රමාදව
- කාර්යක්ෂමව හා සපලතාවයෙන්

ලබාදීමට කැපවී සිටින්නෙමු.

**අපගේ අපේක්ෂාව**

අප ආයතනය කෙරෙහි ඔබ තබා ඇති විශ්වාසය ගැන ඔබට ස්තූති කරන අතර, අපගේ සේවය සඳහා ඔබ විසින් කරනු ලබන ඉල්ලීම්, යුක්ති සහගත සාධාරණ සහ නියමිත කලට ඉදිරිපත් කිරීමෙන් ද, අංග සම්පූර්ණ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ද අපගෙන් අපේක්ෂා කළ හැකි සහ අපේක්ෂා කළ නොහැකි දේ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා තිබීම මගින් ද ඔබට අපට සහයෝගය පළකල හැකි බව දන්වනු කැමැත්තෙමු.

**අපගේ ප්‍රමිතීන්**

ඔබගෙන් ලැබෙන සෑම ලිඛිත ඉල්ලීමකටම ක්ෂණික ප්‍රතිචාර අපෙන් ලැබෙනු ඇත. අපේ ප්‍රතිචාරය දින 07 ක් ඇතුලත දී ඔබට ලැබෙනු ඇත.

ඔබේ ඉල්ලීම සමඟ ඉල්ලා ඇති තොරතුරු, ලිඛිත ලියකියවිලි සහ ගාස්තු ඉදිරිපත් කර ඇත්තේ නම්, ඔබ ඉල්ලා ඇති සේවය අප විසින් දැනුම් දී ඇති කාල පරාසය තුළ ඔබට ලබා දීමට අපි බැඳී සිටින්නෙමු.

අවසාන තීරණය ගැනීම ප්‍රමාද විය හැකි හෝ අනිවාර්යයෙන්ම ප්‍රමාද වන අවස්ථාවක දී හෝ ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වූ විටක එයට හේතුව අප විසින් ක්ෂණිකව දන්වනු ලැබේ.

**පැමිණිලි සහ සහන ලබාදීමේ ක්‍රමවේදය**

අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආචාර සම්පන්නව, අවශ්‍ය උපකාරය හා සේවාවන් ඔබට ලබා දෙනු ලැබේ. ඉහත සඳහන් ප්‍රමිතීන් හා සම්බන්ධ ඔබට ඇති පැමිණිලි පහත සඳහන් නිලධාරීන් වෙත කරුණාකර ලියාපදිංචි කරන්න.

| | | | |
|---|---|---|---|
| නම | :- ටී. ගජේන්ද්‍රන්කුමාර් | නම | :- ඒ.ජේ. බැද්දේවිතාන |
| තනතුර | :- නාගරික කොමසාරිස් | තනතුර | :- පරිපාලන නිලධාරි |
| පිහිටි ස්ථානය | :- බණ්ඩාරවෙල මහා නගර සභාව | පිහිටි ස්ථානය | :- බණ්ඩාරවෙල මහා නගර සභාව |
| දුරකථනය/ෆැක්ස්/ඊ-මේල් | :- 057-2221276 | දුරකථනය/ෆැක්ස්/ඊ-මේල් | :- bwmcuva@gmail.com 057-2222275 |

- සියළු පැමිණිලි ලද බව දින 03 ඇතුළත දන්වන අතර අවසාන පිළිතුර 14 ඇතුළත දන්වනු ලැබේ.

- සේවාලාභී මහජන ඔබෙන් ඉදිරිපත් වන යෝජනා අපි සතුටින් භාර ගනිමු.
  - අ. අපගේ සේවාවන් ලබන ඔබ හෝ ඔබේ නියෝජිතයින් සමඟ අප අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලැබේ. ඔබ අප සමඟ සම්බන්ධ - වීමට අපේක්ෂා කරන්නේ නම් කරුණාකර 057-2222275 දුරකථන අංකයෙන් අමතන්න.

ආ. මෙම ප්‍රඥප්තියට ඇතුළත් කර ඇති කරුණු පිළිබඳ ඔබේ උපදෙස් ලබා ගැනීමට හෝ ඔබේ අදහස් ලබාදීමට ඔබ දක්වන කැමැත්ත ඇතුළත් කර ඔබගේ විස්තර අපගේ www.bandarawela.mc.gov.lk වෙබ් අඩවියට ඇතුළත් කරන්න.

පුරවැසි ප්‍රඥප්තිය, අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ඔබත් අපත් එක්ව දරණ ඒකාබද්ධ ප්‍රයත්නයකි. ලබාදෙන සේවය තවත් වැඩි දියුණු කිරීමට පහත දක්වා ඇති විස්තර (ආයතනයට අදාල විස්තර සඳහන් කරන්න) ලබා දීමෙන් අපට උපකාරී වන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

**ප්‍රඥප්තිය යටතේ ලබාදෙන සේවාවන් නිරතුරුව සංශෝධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට අපි බැඳී සිටිමු.!**